# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජනවාරි 2025

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

අයදුම්කරුවන් විසින් සිදු කරන ලද පොදු වැරදි බොහොමයක් හඳුනාගන්නා ලදී. අසාර්ථක අයදුම්කරුවන් තමන් කළ වැරදි හඳුනාගෙන ඉදිරි විභාගවලදී සාර්ථක වීම සඳහා සියලු මූලධර්ම ඉගෙන ගත යුතුය.

## A - කොටස

### ප්‍රශ්න අංක 01

**(a)** මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය වූයේ ගිණුම්කරණ වෘත්තියේ නව ප්‍රවණතා තුනක් හඳුනා ගැනීමයි. බොහොමයක් අයදුම්කරුවන් නව ප්‍රවණතා පිළිබඳව පොදු අවබෝධයක් පෙන්නුම් කළහ. අයදුම්කරුවන් කිහිප දෙනෙකු වෘත්තියේ මෑතකාලීන වර්ධනයන්ට වඩා ගෝලීයකරණය, සංකලිත වාර්තාකරණය, ඩිජිටල් පරිවර්තනය, AI තාක්ෂණය, දුරස්ථ ශ්‍රම බලකාය යනාදී වශයෙන් යල් පැන ගිය ප්‍රවණතා හඳුනාගෙන තිබුණි.

**(b)** මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම සඳහා භාවිතා කරනු ලබන මිනුම් පදනම් දෙකක් සඳහන් කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මිනුම් පදනම් නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වූ අතර ඇතැම් අයදුම්කරුවන් ඓතිහාසික පිරිවැය, සාධාරණ වටිනාකම, වර්තමාන වටිනාකම, භාවිත අගය, ප්‍රවර්තන පිරිවැය වැනි මිනුම් පදනම් වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මක ලක්ෂණ දක්වා තිබුණි. මෙය මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පනාත්මක ආකෘතිමය රාමුව පිළිබඳ අවබෝධයක් නොමැතිකම සහ ප්‍රශ්නය පිළිබඳ අවබෝධයක් නොමැතිකම පෙන්නුම් කරයි.

### ප්‍රශ්න අංක 02

**(a)** ප්‍රශ්නයේ මෙම කොටසේ අවශ්‍යතාවය වූයේ තිරසාර වාර්තාකරණයේ ප්‍රධාන අරමුණ සඳහන් කිරීමයි. බොහොමයක් අයදුම්කරුවන් තිරසාර වාර්තාකරණයේ ප්‍රධාන අරමුණ නිවැරදිව ප්‍රකාශ කර තිබුණි.

**(b)** මෙම කොටසින් අයදුම්කරුවන්ට සංකලිත වාර්තාකරණයේ මග පෙන්වීමේ මූලධර්ම තුනක් ප්‍රකාශ කිරීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් මූලධර්ම නිවැරදිව ප්‍රකාශ කර නැති අතර, සමහර අයදුම්කරුවන් සංකලිත වාර්තාකරණයේ අන්තර්ගත අංග සමඟ ඒවා පටලවාගෙන තිබුණි. මෙය සංකලිත වාර්තාකරණය පිළිබඳ දැනුමේ මදබවක් පෙන්නුම් කරයි.

### ප්‍රශ්න අංක 03

**(a)** මෙම කොටස දළ ලාභ අනුපාතය සහ ණයගැති එකතු කිරීමේ කාලය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. දළ ලාභ අනුපාතය සහ ණයගැති එකතු කිරීමේ කාලය වර්ධනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ලැයිස්තුගත කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් වඩා හොඳ පිරිවැය පාලනය සහ ණය කළමනාකරණය වැඩි දියුණු කිරීම වැනි අදාළ ක්‍රියාමාර්ග ලියා තිබුණි. කෙසේ වෙතත්, ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකගේ පිළිතුරු වල නිශ්චිතභාවයක් සහ සාධාරනීයකරණයක් දක්නට නොලැබුණි.

**(b)** මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය වූයේ අනුපාත විශ්ලේෂණයේ සීමාවන් තුනක් ලැයිස්තුගත කිරීමයි. බොහොමයක් අයදුම්කරුවන් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ ගුණාත්මක සාධක බැහැර කිරීම වැනි ප්‍රධාන සීමාවන් නිවැරදිව ලැයිස්තුගත කර තිබුණි. කෙසේ වෙතත්, ඇතැම් පිළිතුරුවල අදාළ නොවන කරුණු ඇතුළත් වූ අතර, අනුපාත විශ්ලේෂණයේ සීමාවන් පිළිබඳ අවබෝධයක් නොමැතිකම පෙන්නුම් කරන ලදී. ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය නොසලකා හැරීමෙන්, සීමාවන් වෙනුවට අනුපාත විශ්ලේෂණයේ වාසි ලැයිස්තුගත කර තිබුණි.

### ප්‍රශ්න අංක 04

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 38 - අස්පෘශ්‍ය වත්කම් යටතේ යම් පිරිවැයක් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගත හැකිද යන්න පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නය මගින් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රමිතිය නිවැරදිව යොදාගෙන තිබූ අතර පිරිවැය අස්පෘශ්‍යද නැද්ද යන්න ප්‍රකාශ කළහ. කෙසේවෙතත්, සාමාන්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් එසේ හඳුනා ගැනීමට හේතු පැහැදිලි කර නොතිබුණි. ඇතැම් අයදුම්කරුවන් පුහුණු පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනීමට අසමත් විය.

අයදුම්කරුවන්ගෙන් මාතෘකා පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් පෙන්නුම් කරන අතර, ව්‍යුහගත පිළිතුරු ලබා දීමට, අපැහැදිලි පැහැදිලි කිරීම් වළක්වා ගැනීමට සහ න්‍යායාත්මක සංකල්ප සහ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ දැනුමෙහි නිරවද්‍යතාවය සහතික ගැනීමට ඔවුන්ට උපදෙස් දෙනු ලැබේ.

## B - කොටස

### ප්‍රශ්න අංක 05

2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වක්‍ර ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

බොහොමයක් අයදුම්කරුවන් හොඳින් උත්තර සපයා තිබූ අතර සතුටුදායක ලකුණු ලබා ගත්හ. අයදුම්කරුවන් විසින් සිදු කරන ලද පොදු වැරදි පහත දැක්වේ:

(1) ඇතැම් අයදුම්කරුවන් මෙහෙයුම්, ආයෝජනය සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙන වෙනම වර්ගීකරණය කිරීමට අපොහොසත් වූ අතර පොදුවේ ක්‍රියාකාරකම් ලෙස සඳහන් කර තිබුණි.

(2) ඇතැමුන් ක්‍රියාකාරකම් වෙන වෙනම වර්ගීකරණය කර ඇතත්, ගනුදෙනු නිවැරදි ක්‍රියාකාරකම්වලට වෙන් කිරීමට අපොහොසත් විය. උදා: ලබාගත් දිගුකාලීන ණය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වර්ගකළ යුතු වුවද එය ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන තිබුණි.

(3) බොහොමයක් දෙනෙක් මුදල් ගලා ඒම් වරහන් රහිතවත් මුදල් ගලා යාම් වරහන් තුළත් පෙන්වීමට අසමත් වූහ.

(4) ක්ෂයවීම් ගැලපීම වැරදි ලෙස ගණනය කරන ලදී. ඉවත් කරන ලද යන්ත්‍රය සඳහා ක්ෂය වීම සමුච්චිත ක්ෂය වීමේ ගිණුමෙන් ඉවත් කර නොමැත. මේ හේතුවෙන් ක්ෂය වීම් වැරදියට ගණනය කර තිබීම සහ ඉවත් කිරීමේ ලාභය වෙනුවට වැරදි අලාභයක් ගණනය කර තිබුණි.

(5) මෝටර් රථ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභය වැරදි ලෙස ගණනය කර තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බව සැලකිල්ලට ගෙන නැත. එය ක්ෂය ගණනය කිරීම වැරදීමට හේතු වී ඇත.

(6) ඇතැම් අයදුම්කරුවන් අදාළ වත්කම් ගිණුමෙන් බැහැර කරන ලද යන්ත්‍රයේ පිරිවැය මාරු නොකිරීම හේතුවෙන් නව යන්ත්‍රය මිලදී ගැනීම සඳහා කරන ලද ගෙවීම නිවැරදිව ගණනය කර නොමැත.

(7) ඇතැම් අයදුම්කරුවන් බදු පෙර ලාභය, ආදායම් බදු ගෙවීම සහ ණය සඳහා පොලී වියදම් නිවැරදිව ගණනය කර නොතිබුණි. ඇතැම් අයදුම්කරුවන් බදු පෙර ලාභය ගණනය කිරීම සඳහා බදු පසු ලාභයට බදු වියදම් එකතු කල යුතු වුවද එය අඩු කර ගණනය කිරීම් සිදු කර තිබුණි.

(8) අයදුම්කරුවන් කිහිප දෙනෙකු මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ සංඛ්‍යා වල වෙනස්වීම් වෙනුවට එම සංඛ්‍යා ඒ ආකාරයෙන්ම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 06

අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය සතුටුදායක නොවීය, විශේෂයෙන් ප්‍රශ්නයේ **(b) කොටස** සඳහා අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණක් වෙන් කරන ලද ලකුණුවලින් අඩක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත්හ.

**(a)** කෙටි කාලීන සේවක ප්‍රතිලාභ උදාහරණ දෙකක් සහිතව පැහැදිලි කිරීම අවශ්‍ය විය. කෙටි කාලීන සේවක ප්‍රතිලාභ නිවැරදිව පැහැදිලි කර තිබුණේ අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණි. සේවකයින්ට අදාළ සේවාව සැපයූ වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසන් වී මාස 12 කට පෙර මෙම ප්‍රතිලාභ සම්පූර්ණයෙන් පියවා විය යුතු බව ප්‍රකාශ කිරීමට ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අසමත් වූහ. මෙම කොටස සඳහා අවබෝධයක් නොමැතිකම නිසා බොහොමයක් අයදුම්කරුවන් විවිධ සාවද්‍ය අදහස් දරණ බව පැහැදිලි විය.

ඇතැම් උත්තර වල කෙටි කාලීන ප්‍රතිලාභ වල කොටසක් ලෙස රැකියාවෙන් ඉවත් වූ පසු ලැබෙන ප්‍රතිලාභ සහ රැකියාව අවසන් කිරීමේ ප්‍රතිලාභ ඇතුළත් විය. නිදසුනක් වශයෙන්, කෙටිකාලීන ප්‍රතිලාභ සඳහා උදාහරණ ලෙස සේවක අර්ථසාධක අරමුදල් (EPF), සේවක භාරකාර අරමුදල් (ETF) සහ පාරිතෝෂික ගෙවීම් ලබා දෙන ලදී.

**(b)** ප්‍රශ්නයේ මෙම කොටසින් 2024 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබිය යුතු කල්බදු ගිණුම සහ නොඉපයූ මූල්‍ය ආදායම් ගිණුම පිළියෙළ කිරීම අවශ්‍ය විය. මේ කොටසට නිවැරදිව පිළිතුරු ලබා දී තිබුණේ කිහිප දෙනෙකු පමණි. පහත සඳහන් වැරදි බොහොමයක් අයදුම්කරුවන් විසින් සිදු කර තිබුණි:

(1) ලබාගත් අත්තිකාරම්, වාර්ෂික බදු වාරිකය, මෝටර් රථවල සාධාරණ වටිනාකම ඇතුලත් කර ලැබිය යුතු කල්බදු ගිණුම සකස් කිරීමේදී අයදුම්කරුවන් හර සහ බැර පැති වෙනස් කර තිබුණි.

(2) බොහොමයක් අයදුම්කරුවන් විසින් වාරික ගෙවීම් වට්ටම් කිරීම මගින් අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම නැවත ගණනය කර තිබුණු අතර මුළු වසර පහ සඳහාම කල්බදු ක්‍රමක්ෂය සටහන පෙන්නුම් කර තිබුණි. ඔවුන් මේ සඳහා අනවශ්‍ය ලෙස දිගු කාලයක් ගත කරන්නට ඇත.

(3) සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් අදාළ ප්‍රමාණ නිවැරදිව ගණනය කර තිබියදීත් ලෙජර් ගිණුම් වලට ඇතුළත් කිරීමට අසමත් වී තිබුණි.

(4) අයදුම්කරුවන් ඉතා ස්වල්ප දෙනෙකුගේ පිළිතුරු වලට නොඉපයූ මූල්‍ය ආදායම් ගිණුම ඇතුළත් විය, නමුත් ඒවායින් බොහොමයක් වැරදි විය.

(5) ඇතැම් අයදුම්කරුවන් ගිණුමේ අනෙකුත් මූලිකාංග නිවැරදිව ලබා ගෙන තිබුණද, ඉදිරියට ගෙන යන ලද ශේෂය සහ පහළට ගෙන යන ශේෂ ලියා නොතිබුණි.

## ප්‍රශ්න අංක 07

**(a)** මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 හි ප්‍රතිපාදනය අනුව, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. පහත දැක්වෙන අවස්ථා තුන මත පදනම්ව, LKAS 37 අනුව එක් එක් අවස්ථාව හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. ප්‍රශ්නයේ මෙම කොටස සඳහා බොහොමයක් අයදුම්කරුවන් විසින් වෙන් කරන ලද ලකුණුවල සාමාන්‍යට වඩා ලබා ගන්නා ලදී.

(1) සමාගම විසින් අලෙවි කරන ලද නිෂ්පාදිතයක් භාවිතා කිරීමෙන් පසු හට ගන්නා ලද සෞඛ්‍ය හානියකට අදාලව රුපියල් මිලියනයක වන්දියක් ඉල්ලා ගනුදෙනුකරුවෙකු විසින් නඩු පවරා තිබේ. මෙම මුදල ගෙවීමේ සම්භාවිතාව අඩු බව සමාගමේ නීතිඥයින් ප්‍රකාශ කර ඇතත් අයදුම්කරුවන්ගෙන් බහුතරයක් රුපියල් මිලියනය සඳහා ප්‍රතිපාදන සිදු කිරීමට යෝජනා කර තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන් කිහිප දෙනෙකු නිවැරදිව සඳහන් කර තිබුණේ, අඩු ගෙවීමේ සම්භාවිතාව තක්සේරු කිරීම සමඟ හිමිකම් පෑමේ ස්වභාවය සහ ප්‍රමාණය පැහැදිලි කරමින් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල අසම්භාව්‍ය වගකීමක් ලෙස හෙළිදරව් කිරීම කළ යුතු බවයි.

(2) සමාගම විසින් 2024 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ලාභය මත අවසාන ලාභාංශය 2024 අප්‍රේල් මස 10 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කළ යුතු බව පැහැදිලි කරමින් අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

(3) ආදායම් බදු වගකීම් ගණනය කිරීමේදී සමාගම විසින් ඉඩ දුන් වියදම් ලෙස සලකන ලද රුපියල් මිලියන 2 ක් වූ ඇතැම් වියදම් ඉඩ නොදෙමින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුවක් නිකුත් කරන ලදී. සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව, 2024 අප්‍රේල් මස 30 වන දින රුපියල් මිලියන 1.5 ක වියදම් ඉඩ නොදීමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව එකඟ විය. සාමාන්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කළ යුතු බව නිවැරදිව සඳහන් කර තිබුණි. කෙසේවෙතත්, රුපියල් මිලියන 1.5 ක ඉඩ දිය නොහැකි වියදම් හේතුවෙන් ප්‍රතිපාදන වැඩි කළ යුතුද යන ප්‍රශ්නය තේරුම් ගැනීමට බහුතරය අසමත් විය.

අයදුම්කරුවන් විසින් සපයනු ලබන පිළිතුරු වල නිරීක්ෂණය කරන ලද පොදු දුර්වලතා පහත දැක්වේ:

(1) සිදුවීම් ගැලපිය යුතුය, නොගැලපිය යුතුය හෝ හෙළිදරව් කළ යුතුය යන්න සඳහන් නොකර අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ එය අසම්භාව්‍ය වගකීමක් හෝ අසම්භාව්‍ය වත්කමක් පමණක් වන අතර ඇතැමුන් සඳහන් කර තිබුනේ ඒ සඳහා ප්‍රතිපාදන කළ යුතු හෝ නොකළ යුතු බවයි.

(2) ඇතැම් අයදුම්කරුවන් අදාළ සංසිද්ධිය පිළිබඳ අවසන් තීරණය ප්‍රතිපාදනයක්, අසම්භාව්‍ය වත්කමක්, අසම්භාව්‍ය වගකීමක් ලෙස නොදක්වා ඒවා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය වැනි අපැහැදිලි පිළිතුරු සපයා තිබුණි. ඔවුන් අවම වශයෙන් ඒවා හඳුනාගත යුතු ආකාරය එනම් හෙළිදරව් කිරීම හෝ ගැලපීම් කිරීම වශයෙන් පැහැදිලි කිරීමට අපොහොසත්ව තිබුණි.

(3) අයදුම්කරුවන් කිහිප දෙනෙකු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37ට එදිරිව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 (වාර්තා කරන දිනයට පසු සිදුවීම්) සමඟ පටලවා ව්‍යාකූල උත්තර සපයා තිබුණු අතර, ඇතැම් උත්තර මූලික වශයෙන් දෙවැන්නෙහි මූලධර්ම අවධාරණය කර තිබුණි.

**(b) (i) සුදුසුකම් ලත් වත්කම්:**

"ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 23 - ණය ගැනුම් පිරිවැය අනුව සුදුසුකම් ලත් වත්කමක්" යන යෙදුම උදාහරණයක් සහිතව පැහැදිලි කිරීම අවශ්‍ය විය. ප්‍රශ්නයේ මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදිව පිළිතුරු දී නොතිබුණි. මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

ඇතැම් අයදුම්කරුවන් උපකල්පනය කර ඇත්තේ සුදුසුකම් ලත් වත්කම් යනු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 01 හි දක්වා ඇති පරිදි වත්කම් සඳහා වන ලක්ෂණ සහ හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන වත්කම් බවයි. අයදුම්කරුවන් ඉතා ස්වල්ප දෙනෙක් පමණක් ඔවුන්ගේ පිළිතුරුවල "සැලකිය යුතු කාල පරිච්ඡේදයක්' යන ප්‍රධාන පදය ඇතුළත් කර තිබිණි. තවද ඇතැම් අයදුම්කරුවන්ට LKAS 23 - ණය ගැණුම් පිරිවැය පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා ඒ සඳහා උදාහරණ සැපයීමට අසමත් විය.

**(ii)** ප්‍රශ්නයේ මෙම කොටසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 23 ප්‍රකාරව ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසියක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කිරීමේ කොන්දේසිය නිවැරදිව ප්‍රකාශ කර නොමැත. ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කිරීම සඳහා නිර්ණායක ලැයිස්තුගත කිරීම වෙනුවට, ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනිත කිරීම සලකා බැලීමට සපුරාලිය යුතු මූලික කොන්දේසිවලින් එකක් ඇතැමුන් ප්‍රකාශ කර තිබුණි. උදා: මුදල් ණයට ගෙන ඇත්තේ විශේෂයෙන්ම වත්කම් වැඩිදියුණු කිරීමේ අරමුණින්ය.

## C - කොටස

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය දේපළ, පිරියත සහ උපකරණ වල වෙනස්වීම් දැක්වෙන සටහනද ඇතුළුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සම්බන්ධ විය. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රමාණවත් ලකුණු ලබා ගත් අතර ඉතා ස්වල්ප දෙනෙක් මෙම ප්‍රශ්නයට උත්තර සපයා නොමැති බව සඳහන් විය. අයදුම්කරුවන් විසින් සිදු කරන ලද පොදු වැරදි පහත පරිදි වේ:

(1) බොහොමයක් අයදුම්කරුවන් ණය ගැනුම් පිරිවැය මත පොලිය නිවැරදිව ගණනය කිරීමට සහ ප්‍රාග්ධනිත කළ යුතු මුදල හඳුනා ගැනීමට අසමත් විය.

(2) ඇතැම් අයදුම්කරුවන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම හඳුනාගෙන නොතිබූ අතර ගෙවිය යුතු මුදල වසර සඳහා ආදායම් බදු වියදම ලෙස සැලකූහ.

(3) ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනයේ එම කාලපරිච්ඡේදය සඳහා ලාභයත්, ලාභාංශත් සටහන් කිරීමට නොසැලකිලිමත්කම හේතුවෙන් ඇතැමුන්ට අමතක විය.

(4) ඇතැම් අයදුම්කරුවන් විසින් ගෙවන ලද ලාභාංශ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයට ගැලපීම් කර තිබුණි. මීට අමතරව, කිහිප දෙනෙකු රඳවා ගත් ඉපැයීම්වලට ගෙවන ලද ලාභාංශ එකතු කර තිබුණි, එයද, වැරදි විය.

(5) ඉවත් කරන ලද මෝටර් වාහන සඳහා ක්ෂය ගණනය කිරීම වැරදීම හේතුවෙන් බොහොමයක් අයදුම්කරුවන් ඉවත් කිරීමේ ලාභය නිවැරදිව ගණනය කිරීමට අසමත්ව සිටියහ.

(6) අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් ප්‍රවර්තන ණය මුදලෙහි ජංගම සහ ජංගම නොවන කොටස් වෙනමම හඳුනා ගැනීමට අසමත් විය.

(7) බොහොමයක් අයදුම්කරුවන් යන්ත්‍ර, සූත්‍ර වල හානිකරණ අලාභය ගණනය කිරීමට අසමත් විය. ඇතැම් අයදුම්කරුවන් දේපල, පිරියත සහ උපකරණ (PPE), සටහනේ මෙන්ම ආදායම් ප්‍රකාශනයේ හානිකරණ අලාභය සටහන් කර නොමැත. මෙය හානිකරණය පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා විය හැකිය.

(8) බොල් ණය සඳහා ප්‍රතිපාදන ගණනය කර තිබුනේ රු.1,400/- ක බොල් ණය ආපසු අය කර ගැනීම එකතු කිරීමකින් තොරව එකී මුදල වරදවා ණයගැති ගිණුමට බැර කිරීමෙනි. මීට අමතරව, බොහොමයක් අයදුම්කරුවන් බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන සඳහා කළ යුතුව තිබූ ආපසු හැරවීම හඳුනා ගැනීමට අසමත් විය. තවද, බොල් ණය සඳහා අධි වෙන්කිරීම ආපසු හැරවීම සඳහා නිසි ගැලපීම් කිරීම මෙන්ම කලින් ලියා හරින ලද බොල් ණය ආපසු අයකර ගැනීම ගැලපීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දුර්වල අවබෝධය කැපී පෙනුනි.

(9) සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ලැබිය යුතු පොලිය, කලින් ගෙවීම් ශේෂයන්, උපචිත වියදම් සහ තොගය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්වීමට අසමත් වී ඇත.

(10) ගණනය කරන ලද ක්ෂයවීම්, දේපළ, පිරියත හා උපකරණ වල වෙනස්වීම් දැක්වෙන සටහනේ සිට ආදායම් ප්‍රකාශනයේ පරිපාලන හා බෙදාහැරීමේ වියදම් යටතට ගෙන ඒමට අපොහොසත්ව තිබුණි.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය මගින් අනුපාත පහක් ගණනය කිරීම සහ එකී අනුපාත කර්මාන්ත සාමාන්‍යයන් සමඟ සංසන්දනය කරමින් විචලනයන්ට හේතු විය හැකි කරුණු පැහැදිලි කර සාරාංශගත වාර්තාවක් පිළියෙළ කිරීමට අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් අනුපාත ගණනය කර ගණනය කිරීමේ කොටස සඳහා වෙන් කරන ලද ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණක් සම්පූර්ණ කළ සාරාංශ වාර්තාව සකස් කිරීම සඳහා ලකුණු ලබා ගෙන තිබුණි.

**(a)** අනුපාත ගණනය කිරීමේදී ඇතැම් අයදුම්කරුවන් විසින් පහත සඳහන් වැරදි සිදු කරන ලදී:

(1) දළ ලාභ අනුපාතය ගණනය කිරීමේදී ඇතැම් අයදුම්කරුවන් විකුණුම් වෙනුවට විකුණුම් පිරිවැය සලකා බලා තිබුණි.

(2) ශුද්ධ ලාභ අනුපාතය ගණනය කිරීම සඳහා ඇතැම් අයදුම්කරුවන් බදු පසු ලාභය වෙනුවට බදු පෙර ලාභය හෝ පොලී සහ බදු පෙර ලාභය භාවිතා කර තිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන් ණයගැති එකතු කිරීමේ කාලය ගණනය කිරීම සඳහා ණයට විකුණුම් වෙනුවට මුළු විකුණුම් භාවිතා කළ අතර ඇතැමුන් සාමාන්‍ය ණය ගැතියන් වෙනුවට අවසාන ණය ගැතියන් භාවිතා කළහ.

(4) ඇතැම් අයදුම්කරුවන් ණයහිමි පියවීමේ කාලය ගණනය කිරීම සඳහා ණයට ගැනුම් වෙනුවට මුළු ගැනුම් භාවිතා කර තිබූ අතර සාමාන්‍ය ණයහිමියන් වෙනුවට ඔවුන්ගේ අවසාන ශේෂය හෝ ආරම්භක සහ අවසාන ශේෂවල එකතුව සලකා බලා ඇත.

(5) ඇතැම් අයදුම්කරුවන් කොටසක ඉපැයුම ගණනය කරන ලද්දේ බදු පසු ශුද්ධ ලාභය වෙනුවට, කොටස් හිමියන්ගේ ස්කන්ධය, බදු පෙර ලාභය, පොලී සහ බදු පෙර ලාභය භාවිතා කරමිනි.

**(b)**

(1) ඇතැම් අයදුම්කරුවන් අනුපාත සංසන්දනය කර ඇති අතර විචලනයන්ට හේතු විය හැකි කරුණු දැක්වීමකින් තොරව කර්මාන්තයේ කාර්ය සාධනයට සාපේක්ෂව සමාගමේ කාර්යසාධනය සතුටුදායක හෝ අසතුටුදායක ද යන්න ප්‍රකාශ කර තිබුණි.

(2) ඇතැම් අයදුම්කරුවන් සමාගමේ දෘෂ්ඨිකෝණය වෙනුවට කර්මාන්ත දෘෂ්ටි කෝණයෙන් සමාගම් අනුපාතය සහ කර්මාන්ත සාමාන්‍ය අනුපාතය සංසන්දනය කර තිබුණි.

(3) බොහොමයක් අයදුම්කරුවන්ගේ මතය වූයේ ණයහිමියන්ට කලින් පියවීම සමාගමට හිතකර බවයි.

(4) බොහොමයක් අයදුම්කරුවන් හට ණයගති එකතු කිරීමේ කාලය සහ ණයහිමි පියවීමේ කාලයන්හි විචලනයන්ට හේතු පිළිබඳව දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය.

(5) සමහර අයදුම්කරුවන් කොටසකට ඉපැයුම, කර්මාන්තයේ සාමාන්‍ය ඉපැයීම් සමඟ විචලනයන්ට හේතු දැක්වීම වෙනුවට අඩු ඉපැයීම් තිබීමෙන් වන බලපෑම් ගැන සාකච්ඡා කර තිබුණි.

## ප්‍රශ්න අංක 10

අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය ගණනය කිරීම සහ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කරන ලෙස ප්‍රශ්නයෙන් ඉල්ලා තිබුණි.

පොදුවේ, අයදුම්කරුවන් විසින් එයට හොඳින් පිළිතුරු ලබා සාමාන්‍ය ලකුණු වලට වඩා වැඩි ලකුණු ලබා ගත්හ. බහුතරය ඒකාබද්ධ කිරීමේ සංකල්පය තේරුම් ගෙන ඇති අතර අදාළ ගැලපීම් නිවැරදිව සිදු කර ඇත. **(a) කොටසට** අයදුම්කරුවන් විසින් හොඳින් පිළිතුරු ලබා දෙන ලදී.

අයදුම්කරුවන් විසින් සිදු කරන ලද පොදු වැරදි පහත දැක්වේ:

(1) අයදුම්කරුවන් කිහිප දෙනෙකු සමාගම් දෙකෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වෙන වෙනම ලබා දී තිබුණි.

(2) යන්ත්‍ර සූත්‍ර ඉවත් කිරීම මත ලාභය සහ අදාළ ක්ෂය වීම් ගණනය කිරීමේ දෝෂ.

(3) උපලබ්ධි නොවූ ලාභය නිවැරදිව ගණනය කර වාර්තා කර තිබුනේ නැත.

(4) ඒකාබද්ධ රඳවා ගත් ඉපැයීම් සහ පාලනට යටත් නොවන හිමිකම නිවැරදි නොවීය.

(5) බොහොමයක් අයදුම්කරුවන් සාධාරණ වටිනාකම් ක්‍රමය භාවිතා කරමින් මවු සමාගම සහ පාලනයට යටත් නොවන හිමිකම අතර කීර්තිනාමය වෙන් කිරීමට අපොහොසත් වී තිබුණි.

(6) රඳවා ගත් ඉපැයීම් ගණනය කිරීමේදී, ඇතැම් අයදුම්කරුවන් හර සහ බැර නිවැරදිව තේරුම් ගැනීමට අසමත් විය.

(7) බොහොමයක් අයදුම්කරුවන් අන්තර් සමාගම් ගනුදෙනු ඉවත් නොකර මවු සමාගම සහ පරිපාලිත සමාගමේ සංඛ්‍යා එකතු කිරීමෙන් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබුණි.

(8) අයදුම්කරුවන් කිහිප දෙනෙකු මවු සමාගම සහ පරිපාලිත සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය එකතු කර ඇති අතර, එමඟින් ඒකාබද්ධ කිරීම පිළිබඳ දැනුමක් නොමැති බව පෙන්නුම් කළේය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයට ලිවීම වැදගත්ය. ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටද කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර, පශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම අත්‍යාවශ්‍යය.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම සඳහා අවධානයෙන් කියවා බැලිය යුතුය.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර, යෝජිත උත්තර සහ නියාමක ප්‍රශ්න පත්‍ර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී අපේක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය. දැනුම තහවුරු කරගැනීමට මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

8. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම තීරණාත්මකය. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය. එම කාලරාමුවෙන් පිටපැනීම අවාසිදායකය.

9. පෙර සූදානම සහිතව විභාගය සමත්වීමේ තිරසාර පරම චේතනාවෙන් විභාගය සඳහා පෙනී සිටිය යුතුය.

- * * * -